# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

ජේ.එම්. වසන්ති කුමාරි
අංක 293,
පැලටියාව,
පොළොන්නරුව

<u>**අභියාචක**</u>

**අභියාචනා අංකය :**
**RTIC Appeal/617/2022**

එදිරිව

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
අංක 500
ටී.බී. ජයා මාවත,
කොළඹ 10

<u>**පොදු අධිකාරිය**</u>

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණි වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
5. ඒ.එම් නහියා - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සූම් තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වේ.

පොදු අධිකාරිය වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් / නම් කළ නිලධාරි ඉන්ජිනේරු නිලන්ත ධනපාල මයා, පරිපාලන නිලධාරි චන්දන කුමාර මයා පරිපාලන නිලධාරි (ඉඩම්) එස්.එම් සරත් මයා සහ කළමණාකරන සහකාර එන්. නිරෝෂිනී මිය පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත.

**විභාග කළ දිනය** : 2022.09.15, 2022.10.13, 2022.11.10

**තීරණය කළ දිනය** : 2022.11.10

<u>**කොමිෂන් සභාවේ තීරණය:**</u>

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2021.11.29 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

> *"පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පැලටියාව ගම්මානයේ 75 ඇලේ ගොවීන් 33 දෙනෙකු පමණ වගා කටයුතු කරනු ලබයි. මෙම ගොවින් හට අදාළ කුඹුරු ඉඩම් ලබා දී එම ඉඩම් වලට අදාළ සැලැස්මට අනුව එම ඉඩම් මැනීම සඳහා එක් එක් ගොවියෙකුගෙන් රුපියල් පන්දහසක පමණ මුදලක් ලබා ගෙන ඇත. ඔවුන් විසින් එම ඉඩම් සංවර්ධනය කර වසර හත අටකට පමණ පසුව නැවත ඔහුන් වෙත අදාළ කුඹුරු ඉඩම් සඳහා අලුත් සැලැස්මක් ඉදිරිපත් කර ඇත. නමුත් ඒ සැලැස්මට අදාළව මිනුම් කටයුතු කිරීමක් මහවැලි අමාත්‍යාංශය හරහා සිදුකර නැත. මෙම කුඹුරු ඉඩම් ලබාදී වසර ගණනාවක් ඉක්ම ගියත් තවමත් එම ඉඩම් වල පදිංචිකරුවන් සඳහා ඔප්පු ලබාදී නොමැත.*
>
> *එම ඉඩම් සඳහා ඔප්පු නිකුත් කිරීමට තව කොපමණ කාලයක් ගතවේද යන්න තොරතුරු ලබා දෙන්න.*
>
> *අදාල ඉඩම් සඳහා ඔප්පු ලබා ගැනීමට අප විසින් ගත යුතු පියවර සම්බන්ධයෙන් තොරතුරු ලබා දෙන්න."*

තොරතුරු නිලධාරියා විසින් පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.01.12 දිනැතිව නම්කළ නිළධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිළධාරියා විසින් ද පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2021.03.11 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

අභියාචකගේ 2021.11.29 දිනැති තොරතුරු ඉල්ලීමට සහ 2022.01.12 දිනැති අභියාචනයට ප්‍රතිචාර දැක්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධානවලට අනුකූලව, පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල නියමයන් තුළ පුරවැසියන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලු තොරතුරු ඉල්ලීම් සහ අභියාචනා සඳහා ප්‍රතිචාර දැක්වීමට, පනතෙහි 24 (3) සහ 25 (1) වගන්ති ප්‍රකාරව පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා හටද, පනතෙහි 31(2) සහ 31(3) වගන්ති ප්‍රකාරව නම්කළ නිලධාරියා හට ද පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම පොදු අධිකාරියේ තොරතුරු නිළධාරියා සහ නම්කළ නිළධාරියා විසින් පැහැර හැර ඇත.

**සළකා බැලීම**

අභියාචක විසින් ඉදිරිපත් කරන ලද උක්ත තොරතුරු ඉල්ලීමට පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි ප්‍රතිචාර දක්වා නොමැති අතර ඉන් පසුව අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයටද පොදු අධිකාරියේ නම් කළ නිලධාරි විසින් ප්‍රතිචාර දක්වා නොමැත. මෙම තත්වය පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බරපතල ලෙස උල්ලංඝනය කිරීමකි.

උක්ත පනතේ 24, 25, 27 සහ 28 වන වගන්ති යටතේ තොරතුරු නිලධාරි විසින් තොරතුරු ඉල්ලීමක් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබියදීත් එකී විධිවිධාන පරිදි ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ. එසේම, අභියාචනය ඉදිරිපත් කළ පසු නම් කළ නිලධාරි විසින් ක්‍රියා කළ යුතු ආකාරය පනතේ 31 වන වගන්තිය යටතේ පැහැදිලිව දක්වා තිබියදීත් ඒ පිළිබඳව ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ.

මේ අන්දමින් තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම් කිසිසේත් සැහැල්ලුවෙන් සැළකීමට කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. එබැවින් පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ පනතේ විධිවිධාන යථා පරිදි ක්‍රියාවට නැංවීමට අසමත් වන්නේ නම් ඔවුනට එරෙහිව උක්ත සඳහන් පනතේ 38 වන වගන්තිය යටතේ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාවට සිදු වේ. එබැවින් මින් ඉදිරියට තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය වීම් වළක්වා ගැනීම සඳහා පොදු අධිකාරියෙහි තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි ක්‍රියා කළ යුතු බවට කොමිෂන් සභාව තරයේ අවධාරණය කරයි.

ඉහත තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති කිසිදු තොරතුරක් පනතේ 5 (1) වගන්තියේ දැක්වෙන විධිවිධාන වලින් වාරණය වන බවට කරුණු ඉදිරිපත්ව නොමැත. එබැවින් එම කරුණු සළකා බලා ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමෙන් අභියාචක ඉල්ලා ඇති සියලුම තොරතුරු මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව, 2022.12.01 දිනට ප්‍රථම අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම්, තොරතුරු නිලධාරිට සහ පොදු අධිකාරියට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව නියමිත මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීමට ක්‍රියාකළ යුතු බවට තීරණය කරමු.

එසේම, “2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති (ගාස්තු සහ අභියාචනා කාර්ය පටිපාටිය)” රීති මාලාවේ 11 වන රීතිය යටතේ උක්ත තොරතුරු මුදා හැරීමේදී  පොදු අධිකාරියට ගාස්තු අය කිරීමේ හැකියාව නොලැබෙන බවද මෙහිලා වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමු.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට  කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.